Lesson 20

# **අපි එහෙ ගියා**

We went there

සිදු වී අවසන් වූ ක්‍රියා

මීලගට අපි ඉගෙන ගන්නේ යන්නේ ඉතාම වැදගත් පාඩමක්. සිදුවී අවසන් වූ ක්‍රියා ප්‍රකාශ කරන ආකාරය තමයි අපි මේ පාඩමේදී ඉගෙන ගන්නේ . සිදුවී අවසන් වූ ක්‍රියා, ඒ කියන්නේ අතීත කාල ක්‍රියා අපේ එදිනෙදා කතා බහේදී වැඩි වශයෙන්ම භාවිතා කරන්න සිදු වෙන කාලයක්.
සිදුවී අවසන් වූ ක්‍රියා ප්‍රකාශ කරන්න යොදා ගන්නේ ක්‍රියා පදයේ අතීත රූපය. සුලභ ක්‍රියා පද කිහිපයක අතීත රූප මොනවද කියල අපි බලමු.
මේවා ඉතා වැදගත්. එනිසා ඒවා හොදින් මතක තබා ගැනීමට අවශ්‍යයි. කලින් කියුවා වගේ සිදුවී අවසන් වූ ක්‍රියා අපේ එදිනෙදා භාෂා භාවිතයේදී ගොඩක්ම භාවිතා වෙනවා , ඒ නිසා ඒවා නිවැරදිව ප්‍රකාශ කරන ආකාරය ඉගෙන ගැනීම ඉතාම වැදගත්

පහත දැක්වෙන්නේ අපි දන්නා සුලභ ක්‍රියා පද වල අතීත කාල . ඒ සියල්ල හොදින් මතක තබා ගන්න අවශ්‍යයි

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| come | - | came | go | - | went | eat | - | ate |
| කම් | | කේම් | ගෝ | | වෙන්ට් | ඊට් | | ඒට් |
| එනවා | | ආවා | යනවා | | ගියා | කනවා | | කෑවා |
| give | - | gave | take | - | took | work | - | worked |
| ගිව් | | ගේව් | ටේක් | | ටුක් | ව(ර්)ක් | | ව(ර්)ක්ඩ් |
| දෙනවා | | දුන්නා | ගන්නවා | | ගත්තා | වැඩ කරනවා | | වැඩ කළා |
| run | - | ran | do | - | did | say | - | said |
| රන් | | රෑන් | ඩූ | | ඩිඩ් | සේ | | සේඩ් |
| දුවනවා | | දිව්වා | කරනවා | | කළා | කියනවා | | කිව්වා |
| tell | - | told | see | - | saw | write | - | wrote |
| ටෙල් | | ටෝල්ඩ් | සී | | සෝ | රයිට් | | රෝට් |
| කියනවා | | කිව්වා | දකිනවා | | දැක්කා | ලියනවා | | ලිව්වා |
| read | - | read | keep | - | kept | sleep | - | slept |
| රීඩ් | | රෙඩ් | කීප් | | කෙප්ට් | ස්ලීප් | | ස්ලෙප්ට් |
| කියවනවා | | කියෙව්වා | තබනවා | | තැබුවා | නිදා ගන්නවා | | නිදා ගත්තා |

think - thought
තිංක් තෝට්
හිතනවා හිතුවා

drink - drank
ඩ්‍රින්ක් ඩ්‍රෑංක්
බොනවා බිව්වා

watch - watched
වොච් වොච්ඩ්
නරඹනවා නැරඹුවා

sell - sold
සෙල් සෝල්ඩ්
විකුනනවා විකුණුවා

read - read
රීඩ් රෙඩ්
කියවනවා - කියෙව්වා

start - started
ස්ටාට් ස්ටාටඩ්
පටන් ගන්නවා පටන් ගත්තා

finish - finished
ෆිනිෂ් ෆිනිශ්ඩ්
ඉවර කරනවා ඉවර කලා

help - helped
හෙල්ප් හෙල්ප්ඩ්
උදව් කරනවා උදව් කළා

throw - threw
ත්‍රෝ - ත්‍රෑව්
වීසි කරනවා - වීසි කළා

buy - bought
බයි බෝට්
මිලට ගන්නවා මිලටගත්ත

bring - brought
බ්‍රින් - බ්‍රෝට්
ගේනවා - ගෙනාව

hear - heard
හිය(ර්) හ(ර්)ඩ්
ඇහෙනවා ඇහුනා

look - looked
ලුක් ලුක්ඩ්
බලනවා බැලුවා

ask - asked
ආස්ක් ආස්ක්ඩ්
අහනවා ඇහුවා

put - put
පුට් පුට්
තබනවා තැබුවා

meet - met
මීට් මෙට්
හමුවෙනවා හමුවුනා

drive - drove
ඩ්‍රයිව් ඩ්‍රෝ
රිය පදවනවා රිය පැදවුවා

win - won
වින් වොන්
දිනනවා දිනුවා

play - played
ප්ලේ ප්ලේඩ්
සෙල්ලම් කරනවා සෙල්ලම් කළා

lose - lost
ලූස් ලොස්ට්
නැතිවෙනවා නැතිවුනා

forget - forgot
ෆොගෙට් ෆොගොට්
අමතක කරනවා අමතක කළා

begin - began
බිගින් බිගෑන්
පටන් ගන්නවා පටන් ගත්තා

leave - left
ලීව් ලෙෆ්ට්
පිටත් වෙනවා පිටත් වුනා

think - thought
තිංක් තෝට්
හිතනවා හිතුවා

ඉහත ක්‍රියා පද සහ තවත් ක්‍රියා පද භාවිතා කරමින් අතීත කාලයේ සිදු වූ ක්‍රියාවන් ප්‍රකාශ කිරීමට වාක්‍ය තනන ආකාරය මීලගට බලමු . ඉතාම සරලයි . මෙතැනදී ඒක වචන බහු වචන භේදයක් සැලකෙන්නේ නෑ . වාක්‍යයේ කතෘ ඒක වචන වුනත් බහු වචන වුනත් එකම විදියට තමයි වාක්‍ය හැදෙන්නේ

- අතීත කාල ක්‍රියාවක වාක්‍යය සෑදෙන්නේ ක්‍රියා පදයේ අතීත රූපය යෙදීමෙනි . එහිදී කතෘගේ ඒක වචන බහු වචන භේදය නොසැලකේ

  කතෘ + ක්‍රියාව(අතීත ) + කර්මය

උදාහරණ වාක්‍යය අරගෙන බලමු

I met her today
අයි මෙට් හ(ර්) ටුඩේ
මට අද ඇයව හමු වුනා

I saw him yesterday
අයි සෝ හිම් යෙස්ට(ර්)ඩේ
මම ඊයේ ඔහුව දැක්ක

They came here last week
දේ කේම් හිය(ර්) ලාස්ට් වීක්
ඔවුන් මෙහෙ ආවා ගිය සතියේ

We watched cartoons
වී වොච්ඩ් කාටූන්ස්
අපි කාටූන්ස් බැලුවා

I did my home work
අයි ඩිඩ් මයි හෝම්ව(ර්) ක්
මම මගේ ගෙදර වැඩ කළා

She went to the super market
ෂී වෙන්ට් ටු ද සුප(ර්) මා(ර්)කට්
ඇය සුප(ර්) මා(ර්)කට් එකට ගියා

We heard a sound
වී හ(ර්) ඩ් අ සවුන්ඩ්
අපිට සද්දයක් ඇහුනා

He took my pen
හී ටුක් මයි පෙන්
ඔහු මගේ පෑන ගත්තා

They finished the work
දේ ෆිනිශ්ඩ් ද ව(ර්)ක්
ඔවුන් වැඩේ ඉවර කළා

We slept outside
වී ස්ලෙප්ට් අවුට්සයිඩ්
අපි එළියේ නිදා ගත්තා

She drew a nice picture
ෂී ඩ්‍රෑව් අ නයිස් පික්ච(ර්)
ඇය ලස්සන පින්තූරයක් ඇන්දා

He told me a lie
හී ටෝල්ඩ් මී අ ලයි
ඔහු මට බොරුවක් කිව්වා

He gave me some money
හී ගේව් මී සම් මනි
ඔහු මට සල්ලි ටිකක් දුන්නා

She took some medicine for the fever
ෂී ටුක් සම් මෙඩිසින් ෆෝ ද ෆීව(ර්)
ඇය උනට බෙහෙත් ගත්තා

They helped us
දේ හෙල්ප්ඩ් අස්
ඔවුන් අපිට උදව් කළා

Our team won the match
අව(ර්) ටීම් වොන් ද මැච්
අපේ ටීම් එක මැච් එක දිනුවා

He drove very fast
හී ඩ්‍රෝව් වෙරි ෆාස්ට්
ඔහු ඉතා වේගයෙන් රියධාවනය කළා

It ran away
ඉට් රැන් අවේ
ඌ පැනලා දිව්වා

The car broke down on the way
ද කා(ර්) බ්රෝක් ඩවුන් ඔන් ද වේ
කා(ර්) එක මගදී කැඩුනා

I lost my purse
අයි ලොස්ට් මයි ප(ර් )ස්
මගේ ප(ර් )ස් එක නැති වුනා

We ate at a restaurant
වී ඒට් ඇට් අ රෙස්ටුඅරන්ට්
අපි රෙස්ටුරන්ට් එකකින් කෑවා

They left early
දේ ලෙෆ්ට් අ(ර්)ලි
ඔවුන් වේලාසනින් පිටත් වුනා ( ගියා )

He spent a lot of money
හී ස්පෙන්ට් අ ලොට් ඔෆ් මනි
ඔහු ගොඩක් සල්ලි වියදම් කළා

She blamed me
ෂී බ්ලේම්ඩ් මී
ඇය මට බැන්න

I got angry with him
අයි ගොට් විත් හිම්
මට ඔහුත් එක්ක කේන්ති ගියා

The meeting started at 3
ද මීටිං ස්ටාටඩ් ඇට් 3
රැස්වීම 3 ට පටන් ගත්තා

She phoned me last night
ෂී ෆෝන්ඩ් මී ලාස්ට් නයිට්
ඇය ඊයේ රෑ මට ෆෝන් කළා

I looked at him
අයි ලුක්ඩ් ඇට් හිම්
මම ඔහු දිහා බැලුවා

I went to bed early
අයි වෙන්ට් ටු බෙඩ් අ(ර්)ලි
මම වේලාසනින් ඇදට ගියා

We cleaned our class room
වී ක්ලීන්ඩ් අව(ර්) ක්ලාස් රූම්
අපි අපේ පන්ති කාමරය අස් කළා

ඉහත වාක්‍යය එදිනෙදා ජීවිතයේදී අපි බොහෝවිට නිතර කියන දේවල් . ඔබටත් හැකිවේවිද ඔබේම වාක්‍යය කීපයක් තනන්න ? ඒ සදහා උත්සාහ කරන්න. ඉහත වාක්‍යයම සුළු වෙනස් කරමින් එසේ කල හැකියි

Lesson 20 **Spoken English**

යමක් කරන්න කියල කියන තවත් ඉතාම වැදගත් වෙන වාක්‍ය ඛණ්ඩ කිහිපයක් මේ පාඩමේදීත් අපි ඉගෙන ගන්නවා. අපි මේ වෙනකොට මෙවැනි වාක්‍ය ඛණ්ඩ විශාල ප්‍රමාණයක් දැන ගෙන තිබෙනවා . මතක තියා ගන්න , ගෙදරම කෙනෙක් , හොදම යාලුවෙක් වගේ හැර වෙනත් කෙනෙකුට යමක් කරන්න කියල කියද්දී please - ප්ලීස් - කියන වචනේ ඉස්සරහට යෙදුවොත් තමයි හොඳ. මොකද ඉංග්‍රීසි භාෂාව කතා කරද්දී ඒ ආචාරශීලි භාවය ඉතා වැදගත්

Brush your teeth
බ්‍රෂ් යුව(ර්) ටීත්
දත් මදින්න

Comb your hair
කෝම් යුව(ර්) හෙයා(ර්)
හිස පීරන්න

Wash your face and hands
වොෂ් යුව(ර්) ෆේස් ඇන්ඩ් හෑන්ඩ්ස්
මුහුණ සහ අත් හෝදන්න

Get dressed quickly
ගෙට් ඩ්‍රෙස්ඩ් ක්වික්ලි
ඉක්මනට ඇඳ ගන්න

Put on your shoes
පුට් ඔන් යුව(ර්) ෂූස්
සපත්තු ඇඳන්න

Take off your shoes
ටේක් ඔෆ් යුව(ර්) ෂූස්
සපත්තු ගලවන්න

Put your bag away
පුට් යුව(ර්) බැග් අවේ
බැග් එක අරන් පැත්තකින් තබන්න

Get your bag ready
ගෙට් යුව(ර්) බැග් රෙඩි
ඔයාගේ බැග් එක රෙඩි කරගන්න

Come in
කම් ඉන්
ඇතුලට එන්න

Go out
ගෝ අවුට්
පිටතට යන්න

Be on time
බී ඔන් ටයිම්
වෙලාවට ඉන්න / වෙලාවට එන්න

Finish the work
ෆිනිෂ් ද ව(ර්)ක්
වැඩේ ඉවර කරන්න

Line up
ලයින් අප්
පේලි ගැහෙන්න

Walk in a line
වෝක් ඉන් අ ලයින්
පේලියට යන්න

Sit next to your friend
සිට් නෙක්ස්ට් ටු යුව(ර්) ෆ්‍රෙන්ඩ්
ඔයාගේ යාළුවා ළඟ වාඩිවෙන්න

Write it down
රයිට් ඉට් ඩවුන්
ඒක ලියා ගන්න

Write down the homework
රයිට් ඩවුන් ද හෝම් ව(ර්)ක්
හෝම් වර්ක් ලියාගන්න

Keep it in mind
කීප් ඉට් ඉන් මයින්ඩ්
ඒක මතක තියා ගන්න

Keep silent
කීප් සයිලන්ට්
නිශ්ශබ්දව ඉන්න

Remind me later
රිමයින්ඩ් මී ලේට(ර්)
මට පස්සෙ මතක් කරන්න

Pour some water
පෝ සම් වෝට(ර්)
වතුර ටිකක් වක්කරන්න

Wait for me
වේට් ෆෝ මී
මං එනකල් ඉන්න

Be there in time
බී දෙයා(ර්) ඉන් ටයිම්
වෙලා ඇතුව එතන ඉන්න

Hold this for a second
හෝල්ඩ් දිස් ෆෝ අ සෙකන්ඩ්
පොඩ්ඩකට මේක අල්ලගන්න

Get to the work
ගෙට් ටු ද වර්ක්
වැඩේට බහින්න

Do something quickly
ඩූ සම්තිං ක්වික්ලි
ඉක්මන්ට මොනවා හරි කරන්න

Do it right now
ඩූ ඉට් රයිට් නව්
දැන්මම ඒක කරන්න

Stop your nonsense
ස්ටොප් යුව(ර්) නොන්සන්ස්
ඔයාගෙ විකාර නවත්තන්න

Go back to your seat
ගෝ බැක් ටු යුව(ර්)  සීට්
ඔබගේ ආසනයට ආපසු යන්න

Take  turns
ටේක්  ට(ර්)න්ස්
මාරුවෙන් මාරුවට කරන්න

Keep your desk clean
කීප් යුව(ර්) ඩෙස්ක් ක්ලීන්
ඔබේ මේසය පිරිසිදු තබාගන්න

Speak  politely
ස්පීක්  පොලයිට්ලි
ආචාරශිලිව කතා කරන්න

Pass this to the back
පාස් දිස් ටු ද බැක්
මේක පිටුපසට යවන්න (අතින් අත )

Come  early
කම් අ(ර්)ලි
වේලාසනින් එන්න

Solve the problem together
සෝල්ව් ද ප්‍රොබ්ලම් ටුගෙද(ර්)
එක්කහු වෙලා ගැටලුව  විසඳන්න

Ask any questions
ආස්ක්  එනි  ක්වෙස්චන්ස්
ඕන ප්‍රශ්නයක් අහන්න

Write in complete sentences
රයිට් ඉන් කම්ප්ලීට් සෙන්ටන්සස්
සම්පූර්ණ වාක්‍ය වලින් ලියන්න

Try  your  best
ට්‍රයි යුව(ර්) බෙස්ට්
උපරිම උත්සාහ කරන්න

Follow my instructions carefully
ෆොලෝ මයි ඉන්ස්ට්‍රක්ෂන්ස් කෙයාෆුලි
මගේ උපදෙස් ප්‍රවේශමෙන් අනුගමනය කරන්න

Say  it  again
සේ ඉට් අගේන්
ඒක  ආපහු කියන්න

Don’t bother your classmates
ඩෝන්ට් බොද(ර්) යුව(ර්) ක්ලාස්මේට්ස්
ඔයාගේ පන්තියේ සගයන්ට කරදර කරන්න එපා

Take some medicine
ටේක් සම් මෙඩිසින්
බෙහෙත් ටිකක් ගන්න

Speak one at a time
ස්පීක් වන් ඇට් අ ටයිම්
එකවර එක් කෙනෙක් විතරක් කතා කරන්න

Stay at home today
ස්ටේ ඇට් හෝම් ටුඩේ
අද ගෙදර ඉන්න

Take your parent ‘s permission
ටේක් යුව(ර්) පෙරන්ට්’ස් ප(ර්)මිෂන්
ඔයාගේ දෙමව්පියන්ගේ අවසරය ගන්න

Be punctual
බී පංක්චුවල්
වෙලාවට වැඩ කරන්න

Vocabulary

මෙහි ඉහත දී තිබෙන ක්‍රියාපද ලැයිස්තුව vocabulary වලට ඔබ අනිවාර්යයෙන් පාඩම් කරගතයුතුයි. මුලින්ම ඒ වචන වල තේරුම තමයි පාඩම් කරගත යුත්තේ . වචනය දැක්කම තේරුම ක්ෂණිකව ඔබේ හිතට එන්න ඕන. එවිට ඔබට අසා හෝ කියවා භාෂාව තේරුම් ගැනීමේ හැකියාව ලැබෙනවා . ඊට පසුව දෙවනුව තමයි ඒ වචන නිවැරදිව ලියන්න පුරුදු වෙන්න ඕන . මෙය ක්ෂණිකව කරන්න ඕන කියල අපේක්ෂා කරන්නේ නැහැ . මෙතැන් සිට යම් කිසි කාල රාමුවක් තුල ඔබ ඒ වචන නිවැරදිව ලිවිමේ හැකියාව වර්ධනය කරගත යුතුයි. නමුත් ඒ වචන වල තේරුම නම් දැනට පාඩම් කර ගත යුතුයි . එම පද වලට අමතරව මේ පාඩමේ ආපු මේ වචන ටිකත් vocabulary සදහා දී තිබෙනවා. ඊට අමතරව තවත් වචන කීපයක් ඇතුලත් කරලා තියෙනවා.සියල්ලම හොදින් මතක තබා ගන්න උත්සාහ කරන්න

**Vocabulary** 20

break down - බ්‍රේක් ඩවුන් - බිද වැටෙනවා / ක්‍රියා විරහිත වෙනවා
lie - ලයි - බොරු කියනවා / බොරුව
blame - බ්ලේම් - බනිනවා
blamed - බ්ලේම්ඩ් - බැන්නා

brush - බ්‍රෂ් - බුරුසුව / බ්‍රෂ් කරනවා
comb - කෝම් - පීරනවා
remind - රිමයින්ඩ් - මතක් කරනවා
nonsense - නොන්සන්ස් - පිස්සු / විකාර

instructions - ඉන්ස්ට්‍රක්ශන්ස් - උපදෙස්
permission - ප(ර්)මිෂන් - අවසරය
classmate - ක්ලාස්මේට් - පන්තියේ යහළුවා
stick - ස්ටික් - කෝටුව / දණ්ඩ

stick - ස්ටික් - අලවනවා
screw driver - ස්කෲ ඩ්‍රයිව(ර්) - නියන
hammer - හැම(ර්) - මිටිය
slippers - ස්ලිප(ර්)ස් - සෙරෙප්පු

leg – ලෙග් – කකුල
thigh – තයි – කලවය
knee – නී – දණහිස
ankle – ඇංකල් – වළලු කර

foot – ෆුට් – පාදය (වලලුකරෙන් පහල කොටස )
toe – ටෝ – පා ඇඟිල්ල
sole – සෝල් – පයේ පතුල

heel - හීල් - විලුඹ